


# ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

# ඇබෑර්තු

ශ්‍රී ලංකාවේ එකම අපනයන ණය රක්ෂණ ආයතනය වන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (SLECIC), මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. ශ්‍රී ලාංකික අපනයනකරුවන්ට, බැංකුවලට සහ මූල්‍ය ආයතනවලට ණය කළමනාකරණ විසඳුම් මගින් තොරතුරු, සහාය සහ ආරක්ෂාව සැපයීමේ ව්‍යාපාරයේ අපි නියැළී සිටින්නෙමු

අඛණ්ඩව වර්ධනය වෙමින් ඉදිරියට යන ආයතනයක් වන අප, ශක්තිමත් අන්තර් පුද්ගල කුසලතාවලින් හෙබි සුදුසු අයදුම්කරුවන්ට අපගේ ගෞරවණීය ආයතනය හා එක් වීමට ආරාධනා කරමු.

## 01. සාමාන්‍යාධිකාරී තනතුර - HM 2-2 – පුරප්පාඩු 01

**රැකියා විෂය පථය : -**

සංස්ථාවේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරියා (COO) ලෙස, සාමාන්‍යාධිකාරීවරයා අධ්‍යක්ෂ මණ්ඩලයේ උපායමාර්ගික උපදෙස් ක්‍රියාත්මක කිරීමේදී, ආයතනික ඉලක්ක ඉටුකර ගැනීම සඳහා කණ්ඩායම මෙහෙයවයි.

අධ්‍යාපන සුදුසුකම් (පහත 1 හෝ 2 යටතේ දක්වා ඇති සුදුසුකම් තිබිය යුතු ය.)

1. ආර්ථික විද්‍යාව, සංඛ්‍යාලේඛන හෝ ගණිතය, ව්‍යාපාර පරිපාලනය, වාණිජ්‍යය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් අදාළ ක්ෂේත්‍රයක උපාධියක්.

   සමග

   ආර්ථික විද්‍යාව, සංඛ්‍යාලේඛන හෝ ගණිතය, ව්‍යාපාර පරිපාලනය, වාණිජ්‍යය හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක් පිළිබඳ පශ්චාත් උපාධියක් (මාස්ටර්ස් උපාධිය) හෝ කළමනාකරණ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය.

   සහ

   පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 05 ක් සහිත "කළමනාකරණ මට්ටමේ" අවම වශයෙන් අවුරුදු 18ක සතාථ කළ සේවා වාර්තා සහිත පළපුරුද්ද.

2. ආර්ථික විද්‍යාව, සංඛ්‍යාලේඛන හෝ ගණිතය, ව්‍යාපාර පරිපාලනය, වාණිජ්‍යය පිළිබඳ හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් අදාළ ක්ෂේත්‍රයේ උපාධියක්

   සහ

   ඊනැම අදාළ ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක්.

   සහ

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සතාථ කළ සේවා වාර්තා සමග අවම වශයෙන් අවුරුදු 05 ක පළපුරුද්දක්.

**වයස :** අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** HM 2-2 - 2025 රු. [163,620 - 12x4,850-221,820] + වෘත්තීය දීමනාව, සන්නිවේදන දීමනාව, ඉතිරි නිවාඩු සඳහා වාර්ෂිකව ගෙවීම, වෛද්‍ය ප්‍රතිලාභ ආදිය ඇතුළුව රජයේ අනුමත සියලුම දීමනා (සංස්ථාව විසින් නඩත්තු කරන වාහනය සහ රියදුරු ඇතුළුව)

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව ආරම්භයේ දී රු. 121, 200 වැටුප් පියවරෙහි පිහිටවනු ලැබේ.

## 02. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ) තනතුර - HM 1-3 – පුරප්පාඩු 01

**රැකියා විෂය පථය:-**

- සමස්ත ව්‍යාපාරික අරමුණු සමග ගැළපෙන පුළුල් අලෙවිකරණ උපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහා සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ) සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම.
- කර්මාන්ත ප්‍රවණතා, පාරිභෝගික අවබෝධය සහ ව්‍යාපාර තරගකාරීන් හඳුනා ගැනීම සඳහා වෙළඳපළ පර්යේෂණ සහ විශ්ලේෂණය සිදු කර උපායමාර්ගික තීරණ දැනුම් දීමට මෙම තොරතුරු භාවිත කිරීම
- ඩිජිටල්, සාම්ප්‍රදායික සහ අත්දැකීම් භාවිතය ඇතුළු බහු උපක්‍රමයන් හරහා අලෙවිකරණ ව්‍යාපාර සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම., ඇගයීම සහ මෙහෙයවීම.
- ඉලක්කගත ප්‍රේක්ෂකයින්ට ගැළපෙන සහ වෙළඳ නාමයේ වටිනාකම ඵලදායී ලෙස සන්නිවේදනය කරන සංකල්ප නිර්මාණය කිරීම, පණිවිඩ යැවීම සහ අන්තර්ගතය සංවර්ධනය කිරීම.
- නව නිෂ්පාදන සහ සේවා සඳහා වෙළඳපොළට යාමේ උපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහා නිෂ්පාදන කළමනාකරණ කණ්ඩායම් සමග සහයෝගයෙන් කටයුතු කිරීම.
- වෙළඳපොළේ පිහිටීම හා පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල ප්‍රධාන විශේෂාංග සහ ප්‍රතිලාභ අවධාරණය කරමින් එහි පිරිනැමීම් වෙනස් කිරීම සඳහා නිෂ්පාදන පණිවිඩ යැවීමේ සහ ස්ථානගත කිරීමේ උපාය මාර්ග නිර්මාණය කිරීම.

අධ්‍යාපන සුදුසුකම් (පහත 1 හෝ 2 යටතේ දක්වා ඇති සුදුසුකම් තිබිය යුතුය.)

1. අලෙවිකරණය, ව්‍යාපාර පරිපාලනය, ව්‍යාපාර කළමනාකරණය, වාණිජ්‍යය පිළිබඳ හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් අදාළ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක්

   සමග

   අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (මාස්ටර්ස් උපාධිය) සුදුසුකම් හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක සාමාජිකත්වය

   සහ

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 02 ක් සහිත "කළමනාකරණ මට්ටමේ" සතාථ කළ සේවා වාර්තා සහිත අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද.

2. තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක සාමාජික /පූර්ණ සාමාජිකත්වය

   සහ

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" අවම වසර 15 ක පළපුරුද්ද.

**වයස :** අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** HM 1-3 - 2025 රු. [152,500 - 15 x 4,100 - 214,000] + රජයේ අනුමත සියලුම දීමනා, වෘත්තීය දීමනා, සන්නිවේදන දීමනා, ඉතිරි නිවාඩු සඳහා වාර්ෂිකව ගෙවීම, වෛද්‍ය ප්‍රතිලාභ ආදිය (සංස්ථාව විසින් නඩත්තු කරන වාහනය ඇතුළුව)

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව ආරම්භයේ දී රු. 113, 556 වැටුප් පියවරෙහි පිහිටවනු ලැබේ.

## 03. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම් (අපනයන ණය රක්ෂණ) තනතුර HM 1-3 – පුරප්පාඩු 01

**රැකියා විෂය පථය : -**

- ප්‍රතිරක්ෂණ, වන්දි හා අයකිරීම් සම්බන්ධ සියලු මෙහෙයුම් ක්‍රියාවලීන් පිළිබඳ සමස්ත අධීක්ෂණය.
- සියලුම ණය රක්ෂණ සහ ඇපකර සඳහා ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය කරන කාලානුරූප කළමනාකරණ තොරතුරු පද්ධති වාර්තාව (MIS) කාලෝචිත ලෙස ජනනය කිරීම අධීක්ෂණය කිරීම.
- තත්ත්ව වාර්තා ලකුණු කාඩ්පත (status reports score card) පිළිබඳ සහ ඉහළ ගැනුම්කරු වගකීම් සීමාවන් පිළිබඳ නිර්දේශ සඳහා මග පෙන්වීම.
- ආයතනයේ ඵලදායිතාව ප්‍රශස්ත කිරීම සඳහා හරස් කාර්යබද්ධ ඒකාබද්ධතාව ඵලදායී ලෙස භාවිත කරන බව සහතික කිරීම සඳහා අධීක්ෂණය සහ මග පෙන්වීම.
- ජාත්‍යන්තර රක්ෂණකරුවන් සමග සම්බන්ධ වීම

**අධ්‍යාපන සුදුසුකම් (පහත 1 හෝ 2 යටතේ දක්වා ඇති සුදුසුකම් තිබිය යුතුය.)**

1. ආර්ථික විද්‍යාව, සංඛ්‍යාලේඛන හෝ ගණිතය, ව්‍යාපාර පරිපාලනය, වාණිජ්‍යය, ගිණුම්කරණය, නීතිය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් ඊනැම අදාළ ක්ෂේත්‍රයක ලබා ගත් ප්‍රථම උපාධියක්

   සමග

   අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (මාස්ටර්ස් උපාධිය) සුදුසුකම් හෝ තනතුරේ විෂය පරාසයට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක සාමාජිකත්වය

   සහ

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 02 ක් සහිත "කළමනාකරණ මට්ටමේ" සතාථ කළ සේවා වාර්තා සහිත අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද.

2. තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක සාමාජික/පූර්ණ සාමාජිකත්වය

   සහ

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" අවම අවුරුදු 15 ක පළපුරුද්ද.

**වයස :** අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** HM 1-3 - 2025 රු. [152,500 - 15 x 4,100 -214,000] + රජයේ අනුමත සියලුම දීමනා, වෘත්තීය දීමනා, සන්නිවේදන දීමනා, ඉතිරි නිවාඩු සඳහා වාර්ෂිකව ගෙවීම, වෛද්‍ය ප්‍රතිලාභ ආදිය (සංස්ථාව විසින් නඩත්තු කරන වාහනය ඇතුළුව)

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව ආරම්භයේ දී රු. 113, 556 වැටුප් පියවරෙහි පිහිටවනු ලැබේ.

## 4. සහකාර කළමනාකරු (අලෙවිකරණ) තනතුර MM 1-3 – පුරප්පාඩු 01

**රැකියා විෂය පථය:**

අලෙවිකරණ උපාය මාර්ග නිර්මාණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම, වෙළඳපළ ප්‍රවණතා විශ්ලේෂණය කිරීම, කණ්ඩායම් සමග සහයෝගයෙන් කටයුතු කිරීම සහ වෙළඳ නාම දෘශ්‍යතාව වැඩි දියුණු කිරීම සහ ව්‍යාපාර අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කිරීම.

අධ්‍යාපන සුදුසුකම් (පහත 1 හෝ 2 යටතේ දක්වා ඇති සුදුසුකම් තිබිය යුතු ය.)

1. අලෙවිකරණය, ව්‍යාපාර පරිපාලනය, ව්‍යාපාර කළමනාකරණය, වාණිජ්‍යය පිළිබඳ හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් අදාළ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක්

   සහ

   ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු, අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පශ්චාත් පළපුරුද්ද තිබීම.

2. තනතුරට අදාළ විෂය පරාසයක පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අන්තර් මධ්‍යම විභාගය (Intermediate examination) සමත්ව තිබීම හා තනතුරට අදාළ අවම වශයෙන් වසරක පශ්චාත් පළපුරුද්ද තිබීම

**වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** MM 1-3 - 2025 රු. [96,650 - 10 x 2,480 - 15 x 3,450 – 173,200]

වෘත්තීය දීමනාව, සන්නිවේදන දීමනාව, ඉතිරි නිවාඩු සඳහා වාර්ෂිකව ගෙවීම, වෛද්‍ය ප්‍රතිලාභ ආදිය ඇතුළුව රජයේ අනුමත අනෙකුත් දීමනා.

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව ආරම්භයේ දී රු. 75,143 වැටුප් පියවරෙහි පිහිටවනු ලැබේ.

## 05. කනිෂ්ඨ කළමනාකරු (අලෙවිකරණ) තනතුර JM 1-2 - පුරප්පාඩු 01

**රැකියා විෂය පථය :**

අලෙවිකරණ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම, වෙළඳපළ ප්‍රවණතා විශ්ලේෂණය කිරීම, කණ්ඩායම් සමග සහයෝගයෙන් කටයුතු කිරීම සහ වෙළඳ නාම දෘශ්‍යතාව වැඩි දියුණු කිරීම සහ ව්‍යාපාර අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපාර මෙහෙයවීම.

**අධ්‍යාපන සුදුසුකම් (පහත 1 හෝ 2 යටතේ දක්වා ඇති සුදුසුකම් තිබිය යුතුය.)**

1. අලෙවිකරණය, ව්‍යාපාර පරිපාලනය, ව්‍යාපාර කළමනාකරණය, වාණිජ්‍යය පිළිබඳ හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් අදාළ ක්ෂේත්‍රයක ලබා ගත් ප්‍රථම උපාධියක්.
2. තනතුරට අදාළ විෂය පරාසයක පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අන්තර් මධ්‍යම විභාගය (Intermediate Examination) සමත්ව තිබීම

**වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** JM 1-2 - 2025 රු. [74,010-10X1,360-18X2040-124,330]

ඉතිරි නිවාඩු සඳහා වාර්ෂිකව ගෙවීම, වෛද්‍ය ප්‍රතිලාභ ආදිය ඇතුළුව රජයේ අනුමත අනෙකුත් දීමනා

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව ආරම්භයේ දී රු. 59, 552 වැටුප් පියවරෙහි පිහිටවනු ලැබේ.

## 06. කනිෂ්ඨ කළමනාකරු (තොරතුරු තාක්ෂණ) තනතුර - JM 1-2 පුරප්පාඩු 01

**රැකියා විෂය පථය :**

තොරතුරු තාක්ෂණ අංශයට සහාය වීම සහ විවිධ තොරතුරු තාක්ෂණ කාර්යන්, ව්‍යාපෘති සහ කණ්ඩායම් කළමනාකරණයට සහාය වීම. ආයතනයේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ පද්ධතිවල සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා කළමනාකරු (තොරතුරු තාක්ෂණ) ගේ අධීක්ෂණය යටතේ කනිෂ්ඨ කළමනාකරු (තොරතුරු තාක්ෂණ) කටයුතු කරනු ලැබේ.

අධ්‍යාපන සුදුසුකම් (පහත 1 හෝ 2 හෝ 3 හෝ 4 යටතේ දක්වා ඇති සුදුසුකම් තිබිය යුතුය.)

1. පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් අදාළ ක්ෂේත්‍රයක ලබා ගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම
2. තනතුරට අදාළ ක්ෂේත්‍රයේ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 07 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.
3. තනතුරට අදාළ ක්ෂේත්‍රයේ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 06 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   සහ

   අදාළ වෘත්තීය සුදුසුකම ලබාගැනීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු පහක (05) පශ්චාත් පළපුරුද්ද.

4. තනතුරට අදාළ ක්ෂේත්‍රයේ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 05 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   සහ

   අදාළ වෘත්තීය සුදුසුම ලබා ගැනීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දහයක (10) පශ්චාත් පළපුරුද්ද.

**වයස :** අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** JM 1-2 - 2025 රු. [74,010-10X1,360 -18X2040-124,330]

ඉතිරි නිවාඩු සඳහා වාර්ෂිකව ගෙවීම, වෛද්‍ය ප්‍රතිලාභ ආදිය ඇතුළුව රජයේ අනුමත අනෙකුත් දීමනා.

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව ආරම්භයේ දී රු. 59, 552 වැටුප් පියවරෙහි පිහිටවනු ලැබේ.

## 07. කනිෂ්ඨ කළමනාකරු (හිමිකම් සහ අයකරගැනීම්) තනතුර JM 1-2 - පුරප්පාඩු 01

**රැකියා විෂය පථය:**

අපනයන ණය රක්ෂණ හිමිකම් සැකසීම සහ තක්සේරු කිරීම, කොටස්කරුවන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම සහ රක්ෂණ ආශ්‍රිත ගැටලු සහ සංවිධානයේ අයකර ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව විසඳීම සහතික කිරීම

**අධ්‍යාපන සුදුසුකම්**

නීතිය, වාණිජ්‍යය, ගිණුම්කරණය, මූල්‍ය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් අදාළ ක්ෂේත්‍රයක ලබා ගත් ප්‍රථම උපාධියක්.

**වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** JM 1-2 - 2025 රු. [74,010-10X1,360-18X2040-124,330]

ඉතිරි නිවාඩු සඳහා වාර්ෂිකව ගෙවීම, වෛද්‍ය ප්‍රතිලාභ ආදිය ඇතුළුව රජයේ අනුමත අනෙකුත් දීමනා.

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව ආරම්භයේ දී රු. 59, 552 වැටුප් පියවරෙහි පිහිටවනු ලැබේ.

## 08. සාමාන්‍යාධිකාරී සඳහා පුද්ගලික සහකාර තනතුර MA 1-2 - පුරප්පාඩු 01

**රැකියා විෂය පථය:**

සාමාන්‍යාධිකාරීවරයාගේ පරිපාලන කටයුතු පහසුව සඳහා නිසියාකාරව ලිපිගොනු පවත්වාගෙන යාම සහ සියලු රාජකාරී කටයුතු සුමටව ඉටු කිරීම සඳහා අවශ්‍ය සහයෝගය නිසියාකාරව ලබා දීම.

**අධ්‍යාපන සුදුසුකම්**

i සිංහල / දෙමළ
ii ඉංග්‍රීසි භාෂාව
iii ගණිතය

ඇතුළු විෂයයන් හතරක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව එක්වර විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

සහ

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී විෂයයන් තුනක් (සාමාන්‍ය දැනුම ප්‍රශ්න පත්‍රය හැර) සමත් වී තිබීම

සහ

අදාළ ක්ෂේත්‍රයට අදාළව NVQ 03 මට්ටමේ සුදුසුකම ලබා තිබීම.

**වයස :** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** MA 1-2 -2025 රු. [46,220 -10 x540 – 7x630-12x1,080 -12x1,280-84,350]

ඉතිරි නිවාඩු සඳහා වාර්ෂිකව ගෙවීම, වෛද්‍ය ප්‍රතිලාභ ආදිය ඇතුළුව රජයේ අනුමත අනෙකුත් දීමනා.

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව ආරම්භයේ දී රු. 40, 403 වැටුප් පියවරෙහි පිහිටවනු ලැබේ.

### පොදු කොන්දේසි

සෑම අයදුම්කරුවෙකුම,

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- තනතුරේ රාජකාරි මැනවින් ඉටුකරලීමට මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

ඉහත තනතුරු සඳහා වන අයදුම්පත්, අදාළ සහතිකවල ඡායා පිටපත් සහ නෑදෑයින් නොවන නිර්දේශකයින් (non related refrees) දෙදෙනෙකු සමග, 2025 මැයි 14 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි "**සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව, 4 වන මහල, NDB-EDB කුලුන, අංක 42, නවම් මාවත, කොළඹ 02.**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම් කරන තනතුර ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

SLECIC
Information, Support & Protection

Chairman & Managing Director
Sri Lanka Export Credit Insurance Corporation
Level 4, NDB - EDB Tower,
No 42,Nawam Mawatha,
Colombo 02.

Telephone : 011 2307519
Fax : 011 2307515
Web : www.slecic.lk